මගේ අංකය :- ED/02/03/02/07(VII)

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,

අංක 353,

කෝට්ටේ පාර,

රාජගිරිය.

2025.07.03

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරට උසස් කිරීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම - 2024 (2025)**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරට උසස් කිරීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම - 2024 මැයෙන් වූ මගේ අංක ED/02/03/02/07(VI) හා 2024.03.18 දිනැති අයදුම්පත් කැඳවීමේ නිවේදනය මෙයින් අවලංගු කරමි.

සුරාබදු දෙපාර්තමේන්තුවේ 2024.12.19 වන දිනට පුරප්පාඩු වී ඇති ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරු 19ක් සඳහා සාමාන්‍ය කාර්යය සාධනය මත ශ්‍රේණි උසස් කිරීම මඟින් සුදුස්සන් තෝරා ගැනීම පිණිස, අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018.01.18 වන දින අනුමත කරන ලද සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු මහ සැරයන්, සුරාබදු පරීක්ෂක හා ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරු සඳහා වන ***බඳවා ගැනීමේ පරිපාටියේ 10.1.1.1 අනුව සුදුසුකම් ලත්, දෙපාර්තමේන්තුවේ සුරාබදු පරීක්ෂකවරුන්ට*** අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

02. ඒ අනුව සුදුසුකම් සපුරා ඇති, සුරාබදු පරීක්ෂකවරුන් තම අයදුම්පත් පිටපත් දෙකකින් සකසා එක් පිටපතක් සහකාර සුරාබදු කොමසාරිස් මඟින් ද, අනෙක් පිටපත සෘජුව ද **2025 ජූලි 11 වන දිනට හෝ ඊට පෙර** ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ***"ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත"*** යනුවෙන් සඳහන් කළ යුතු අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සුරාබදු කොමසාරිස් ජනරාල්,

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,

අංක 353,

කෝට්ටේ පාර,

රාජගිරිය.

03. සපුරාලිය යුතු සුදුසුකම් :-

1. සුරාබදු පරීක්ෂක තනතුරෙහි ස්ථිර කර තිබීම.

2. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම
3. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සුරාබදු පරීක්ෂකවරයෙකු වශයෙන් වසර අටක (08) සේවා කාලයක් සපුරා තිබීම.
4. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
5. ඉල්ලුම් කරන දිනයේ සිට පූර්වාසන්න වසර පහ (05)ක කාලය තුළදී සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබීම.
6. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ (අවවාද කිරීමක් හැර) විනයානුකූල දඬුවමකට භාජනය වී නොතිබිය යුතුය.

04. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමේ ක්‍රමය

1. <u>ජ්‍යෙෂ්ඨතාවය</u> — <u>ලකුණු 60</u>

සුරාබදු පරීක්ෂක තනතුරේ ප්‍රථම සතුටුදායක සේවා කාලය වසර 05න් පසුව — රා.සේ.කො.ච.ලේ. 01/2019 අනුව

2. <u>කුසලතාවය</u> — <u>ලකුණු 35</u>

(I) පසුගිය වසර 05 තුළ කාර්ය සාධන ඇගයීම — ලකුණු 20

ඒ අනුව එක් වර්ෂයක් සඳහා

| | |
|---|---|
| විශිෂ්ඨ | - ලකුණු 04 |
| සාමාන්‍ය ප්‍රමාණයට වඩා වැඩි | - ලකුණු 03 |
| සතුටුදායක | - ලකුණු 01 |

(II) ප්‍රශංසා — ලකුණු 15

(පසුගිය වසර 05 තුළ ලබාගත්)

| | |
|---|---|
| විශිෂ්ඨ සේවා ඇගයීම් | - ලකුණු 05 |
| විශේෂ සාධු සටහන් | - ලකුණු 04 |
| සාධු සටහන් | - ලකුණු 02 |

(III) සම්මුඛ පරීක්ෂණය — ලකුණු 05

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018.01.18 වන දින අනුමත කරන ලද සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු මහ සැරයන්, සුරාබදු පරීක්ෂක හා ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ

10.1.1.2 අනුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරු වලට බඳවා ගනු ලැබේ.

05. වැටුප් පරිමාණය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව වැටුප් කේතය RS 5 – 2025 වේ. ඒ අනුව තනතුරට හිමි වැටුප් පරිමාණය 72800-17x1400-96600 (මාසික)

06. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

1. මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත වේ.

2. දිවයිනේ කවර ප්‍ර දේශයක වුවද සේවය කිරීමට නියම කරනු ලැබිය හැකිය.

3. මෙම තනතුරට පත්ව වසර තුනක් (03) ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය. (වාචික පරීක්ෂණයකි.)

| විෂය | විෂය නිර්දේශය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. උසාවි රාජකාරි, කාර්යාල පරිපාලනය සහ මුදල් රෙගුලාසි | උසාවි රාජකාරි, කාර්යාල පරිපාලනය සහ මුදල් රෙගුලාසි සහ රජයේ සැපයුම් ක්‍රියාවලිය පිළිබඳ දැනුම මැන බලනු ලැබේ. | 100 | 40 |

07. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්යය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

03/01/2025

යූ.එල්. උදය කුමාර පෙරේරා

සුරාබදු කොමසාරිස් ජනරාල්

යූ.එල්. උදය කුමාර පෙරේරා
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

| අනුක්‍රමික අංකය | |
|---|---|

<u>ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරට</u>

<u>උසස් කිරීමේ ඉල්ලුම් පත්‍රය - 2024 (2025)</u>

I කොටස (නිලධාරියා විසින් සම්පූර්ණ කිරීම සඳහා)

01. (අ) නිලධාරියාගේ නම :- ..................................................

(ආ) ලිපිනය (1) කාර්යාලයීය :- ..................................................

(2) පෞද්ගලික :- ..................................................

(3) ස්ථිර පදිංචි :- ..................................................

(4) දුරකථන අංකය :- ..................................................

(ඇ) උපන්දිනය :- ..................................................

(ඈ) මුල් පත්වීමට අදාළ :- (I) තනතුර :- ..................................................

(II) පත්වීමේ දිනය :- ..................................................

(III) සේවය ස්ථිර කළ දිනය :- ..................................................

02. ලබා ඇති උසස්ම අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් :-

(I) ..................................................

(II) ..................................................

(III) ..................................................

(IV) ..................................................

(V) ..................................................

03. දැනට දරණ තනතුර පිළිබඳ තොරතුරු :-

(I) පත්වූ දිනය :-

(II) ස්ථිර කළ දිනය :-

(III) ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට සුරාබදු පරීක්ෂක තනතුරේ සේවා කාලය :- අවුරුදු - .................. මාස - .................. දින - ..................

04. සුරාබදු පරීක්ෂකවරුන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබේද ? ..............................
සමත් වූයේ නම් එම විස්තර (දෙපාර්තමේන්තුවේ "අයි" පරීක්ෂණය ද ඇතුළුව)
(සමත් විෂයයන් වෙන වෙනම ලියන්න)

| විෂයය | | දිනය | ලකුණු / සමත් /අසමත් බව |
|---|---|---|---|
| "C" | පරීක්ෂණය | ........................... | ........................... |
| "D" | පරීක්ෂණය | ........................... | ........................... |
| "E" | පරීක්ෂණය | ........................... | ........................... |
| "D" II | පරීක්ෂණය | ........................... | ........................... |
| "E" II | පරීක්ෂණය | ........................... | ........................... |
| "G" | පරීක්ෂණය | ........................... | ........................... |
| "I" | පරීක්ෂණය | ........................... | ........................... |

05. (අ) ඉල්ලුම් කරන දිනයේ සිට පූර්වාසන්න පස්(05) අවුරුදු කාලය තුළ :-

(I) සියලුම වැටුප් වර්ධක උපයා ගෙන තිබේද ? ..................................................
(නැතිනම් විස්තර කරන්න)

(II) සිදුකර ඇති වරදක් සම්බන්ධයෙන් ඔබ විනයානුකූල දඬුවමකට භාජනය වී තිබේද ?
(විස්තර කරන්න) ...............................................................................................
...............................................................................................................

06. (අ) ඔබ ලබා ඇති ප්‍රශංසාත්මක වාර්තා පිළිබඳ විස්තර (පසුගිය වසර 05 තුළ ලබාගත්)

(I) විශිෂ්ය සේවා ඇගයීම :- ...............................................................

(II) විශේෂ සාධු සටහන් :- ...............................................................

(III) සාධු සටහන් :- ...............................................................

(දින වකවානු සහිතව ලිවිය යුතු අතර, එය ඇමුණුමක් ලෙස දැක්වීම වඩාත් සුදුසුය.)

(ආ) අදාළ වෙනත් සුදුසුකම් :-

(I) ...............................................................................................

(II) ...............................................................................................

(III) ...............................................................................................

07. ඔබ දිවයිනේ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මානසික හා ශාරීරික සෞඛ්‍ය තත්වයක සිටින්නේදැයි සඳහන් කරන්න. :- ...............................................................

ඉහත සපයා ඇති විස්තර මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුර සඳහා තෝරා ගතහොත්, සුරාබදු ආඥා පනතේ නීති රෙගුලාසි වලට අමතරව රාජ්‍ය සේවාවේ පොදු කොන්දේසි වලට එකඟව, සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් දන්වනු ලබන දිවයිනේ කවර හෝ ප්‍රදේශයක සේවය සඳහා යාමට කැමති බවත් සහතික කර ප්‍රකාශ කරමි.

අයදුම්කරුගේ අත්සන :- ...............................................................

දිනය :- .................................

## II කොටස

සහකාර සුරාබදු කොමසාරිස්ගේ නිර්දේශය

දැනට ............................................................... (තනතුර) ලෙස ...............................................
................................ (සේවා ස්ථානය) සේවය කරන ...............................................................
මහතාගේ අයදුම්පතෙහි දක්වා ඇති තොරතුරු නිවැරදිය. එම ඉල්ලුම්පත දැක්වෙන හේතූන් මත නිර්දේශ කරමි. / නිර්දේශ නොකරමි. (නිර්දේශ නොකරන්නේ නම් හේතූන් දැක්විය යුතුය.)
...............................................................................................................
...............................................................................................................
...............................................................................................................

සහකාර සුරාබදු කොමසාරිස්
2025.07.